**26-06-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ දැන් නින්දා, ප්‍රශංසා, ගෞරව, අගෞරව, සතුට සහ දුක දරා ගත යුතුයි. ඔබගේ සතුටෙහි දින, දැන් ආසන්නයට පැමිණෙනවා.

**ප්‍රශ්නය:** පියා, ඔහුගේ බ්‍රහ්මිණ් දරුවන්ට දෙන අනතුරු ඇඟවීම කුමක්ද?

**පිළිතුර:** දරුවනි, කිසිම විටෙක පියා සමඟ අමනාප නොවන්න. ඔබ පියා සමඟ අමනාප වන්නේ නම්, ඔබ ඔබගේ විමුක්තිය සමඟත් අමනාප වනවා. පියා ඔබට අනතුරු අඟවනවා : අමනාප වන අයට දැඩි දඬුවම් විඳීමට සිදුවෙයි. ඔබ එකිනෙකා සමඟ හෝ ඔබගේ බ්‍රහ්මිණ් ගුරුවරයා සමඟ අමනාප වන්නේ නම්, එවිට මලක් වනවා වෙනුවට ඔබ කටුවක් වෙයි. එබැවින් මේ ගැන බොහෝ ප්‍රවේශම් වන්න.

**ගීතය:** ඉවසන්න අහෝ සිත! ඔබගේ සතුටෙහි දින වැඩි ඈතක නොවෙයි!

ඕම් ශාන්ති. ඔය සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැතිව සිට දැන් හමු වූ දරුවන්ට ගීතය ඇසුණා. ඔය දරුවන්ගේ බොහෝ උපත් ගණනාවක සියලු දුක්, මේ වන විට ඉවත්ව ගොස් ඇති. මෙම ගීතයේ පද පේළිය ඔබට ඇසුණා. ඔබගේ දුක් චරිත කොටස් දැන් අවසන් වන බවත් සතුටෙහි චරිත කොටස් ආරම්භ වීමට යන බවත් ඔබ දන්නවා. මෙය පැහැදිලිව නොවැටහෙන අය, එක් හෝ තව දෙයක් ගැන, නිසැකයෙන්ම දුක් විඳිනවා ඇති. මෙහි බාබා වෙතට පැමිණීමෙන් පසුවත්, ඔවුන් අනිවාර්යයෙන්ම එක හෝ තව දෙයක් ගැන දුක් විඳියි. බොහෝ දරුවන්ට අපහසුතාවයන් ඇති බව බාබාට වැටහෙනවා. මිනිසුන් වන්දනා ගමනක යන විට, විටෙක බොහෝ සෙනඟ, විටෙක තද වැසි සහ විටෙක කුණාටු වුවද ඇතිවෙයි. සැබෑ බැතිමතුන් වන අය පවසන්නේ ‘අප දෙවියන් වෙතට යන නිසා, එයට කමක් නැහැ‘. ඔවුන් එම වන්දනා ගමන යන්නේ ඔවුන් දෙවියන් වෙතට යන බව සිතමින්ය. මනුෂ්‍යයින්ට බොහෝ දෙවිවරු සිටියි! ඔවුන්ගේ විශ්වාසයේ, බොහෝ සෙයින් ස්ථිර අය පවසන්නේ එයට කමක් නැත, හොඳ දෙයක් කරන විට සෑම විටෙකම බාධා ඇති වෙයි. ඔවුන් ආපසු හැරෙන්නේ නැත. ඇතැම් අය ආපසු හැරෙයි. ඇතැම් විට බාධක තිබෙන අතර, ඇතැම් විට නැත. පියා පවසන්නේ දරුවනි, ඔබගේ වන්දනා ගමන මෙයයි. ඔබ කියන්නේ ඔබ අසීමිත පියා වෙතට යන බවයි. පියා සෑම කෙනෙකුගේම දුක නැති කරයි. ඔබට මෙම විශ්වාසය තිබේ. බලන්න, මේ දිනවල මධුබාන් වලට කොපමණ සෙනග එනවාද කියා. බොහෝ දෙනෙකුට අපහසුකම් වලට මුහුණ දීමට සිදුවනු ඇතැයි, බාබා බොහෝ සැලකිලිමත් වනවා. සමහරෙකුට බිම නිදාගැනීමට පවා සිදුවෙයි. ඔහුගේ දරුවන් බිම නිදාගන්නවාට බාබා කැමති නැහැ. කෙසේවෙතත්, නාටකයට අනුව, පෙර චක්‍රයේද විශාල සෙනඟක් සිටි අන්දමින්ම, විශාල සෙනඟක් පැමිණෙයි, එමෙන්ම මෙය නැවතත් සිදුවෙයි. මේ ගැන ඔබ කිසිම දුකක් අත් විඳිය යුතු නැත. ඉගෙන ගන්නා අයගෙන්, ඇතැමෙක් රජවරුන් වන අතර, ඇතැමෙක් දුගියන් වන බවත් ඔබ දන්නවා. ඇතැමෙකුට උසස් තත්ත්වයක් ලැබෙන අතර, ඇතැමෙකුට අඩු තත්ත්වයක් ලැබෙයි, නමුත් සෑම කෙනෙකුටම අනිවාර්යයෙන්ම සතුට ලැබෙයි. සමහර දරුවන් කෙතරම් දුර්වලද යත්, ඔවුන්ට කිසි දෙයක් දරා ගත නොහැකි බව බාබා දන්නවා. ඔවුන්ට යම් කරදරයකට මුහුණ පෑමට සිදුවූවා නම්, ඔවුන් පවසන්නේ ‘අපගේ මෙහි පැමිණීම, කිසි වැඩකට නැහැ!‘ එසේ නැත්නම් ඔවුන් පවසන්නේ, ඔවුන්ගේ බ්‍රහ්මිණ් ගුරුවරයා ඔවුන්ට මෙහි පැමිණීමට බලකළ බවයි. ඔවුන්ගේ බ්‍රහ්මිණ් ගුරුවරයා, හේතුවක් නැතිව ඔවුන්ව සිර කළ බව කියන, ඇතැම් දරුවන්ද සිටිනවා. ඔවුන් පැමිණ ඇත්තේ ලෝක විශ්ව විද්‍යාලයට බව, ඔවුන් සම්පූර්ණයෙන්ම හඳුනාගන්නේ නැත. මෙකල මෙම ඉගෙනුම හැදෑරීමෙන්, ඇතමෙක් රජවරු වන අතර ඇතමෙක් අනාගතයේදී දුගියන් බවටද පත් වෙයි. කෙසේවෙතත්, මෙහි සිටින රජවරුන් සහ දුගියන් අතර සහ එහි සිටින රජවරුන් සහ දුගියන් අතර, දිවා රාත්‍රිය මෙන් වෙනසක් තිබේ. මෙහි දුගියන් මෙන්ම රජවරුන්ද සිටින්නේ දුකෙන්ය. එහි, දෙගොල්ලන්ම සතුටිනි. මෙහි ලෝකය, අපවිත්‍ර මෙන්ම දූෂිතද වෙයි. පියා විස්තර කරන්නේ මෙහි කෙනෙකුට බොහෝ ධනය තිබුණත් ඒ සියල්ලම දූවිලි බවට පත් වීමටයි යන්නේ. මෙම සිරුරුද විනාශ වෙයි. ජීවාත්ම, දුහුවිලි බවට පත් වන්නේ නැත. බිර්ලා වැනි බොහෝ ධනවත් මිනිසුන් සිටියද, මෙම පැරණි ලෝකය පරිවර්ථනය වීමට යන බව ඔවුන්ට අවබෝධ නොවෙයි. ඔවුන් මෙය වටහාගන්නේ නම්, ඔවුන් සැනෙකින් මෙහි පැමිණෙනු ඇත. දෙවියන් මෙහි පැමිණ ඇති බව, ඔවුන් කියයි. අවසානයේදී ඔවුන් වෙන කොහේ යන්නද? පියා නොමැතිව, කිසි කෙනෙකුට විමුක්තිය ලැබෙන්නේ නැත. කෙනෙක් අමනාප වන්නේ

නම්, ඔහු තම විමුක්තිය සමඟ අමනාප වන බව කියැවේ. බොහෝ දෙනෙක් මේ අන්දමින් අමනාප වී, ඉන්පසුව ඇද වැටෙයි. මෙම දැනුමට සවන් දෙන විට විශ්මයට පත් වන අය සිටියි. ඔවුන්ට බොහෝ සේ විශ්වාසය තිබේ. මෙය හැර, සැබවින්ම වෙනත් මඟක් නැති බව, ඇතැම් අය විශ්වාස කරයි. ඔබගේ සාමයේ සහ සතුටෙහි උරුමය ලැබෙන්නේ, මෙය මඟින් පමණයි. බාබා නොමැතිව, සාමය සහ සතුට සොයාගැනීම කිසිසේත් කළ නොහැක. ඔබට බොහෝ ධනය ඇති විට පමණයි සතුට අත්විඳීමට හැකි වන්නේ. ධනය තිබීමේ සතුටක් ඇත. එහි, අශාරීරික ලෝකයේදී ජීවාත්ම, නිහඬව අසුන් ගෙන සිටියි. ඇතැම් අය කියන්නේ, ඔවුන්ට චරිත කොටසක් රඟපෑමට නොතිබුණේ නම්, ඔවුන් නිරතුරුවම එහි උඩ සිටින බවයි. කෙසේවෙතත්, එසේ පැවසුවා කියා, එය එසේ සිදුවන්නේ නැත. මෙම නාටකය පෙර නියම වූ එකක් බව ඔය දරුවන්ට පවසා තිබේ. බොහෝ දරුවන් එක් හෝ තව දෙයක් ගැන සැක ඇති කර, ඉන්පසුව පිටව යයි. ඔවුන්ගේ ගුරුවරයා සමඟ හෝ එකිනෙකා සමඟ අමනාපකම් ඇති කරගෙන, ඉගෙනගැනීම නවත්වයි. ඔබ දැන් මෙහි පැමිණ ඇත්තේ මල් බවට පත් වීමටයි. ඔබ කටු වලින් මල් බවට වෙනස් වන බව ඔබට සැබවින්ම දැනෙයි. ඔබ අනිවාර්යයෙන්ම මල් විය යුතුයි. සමහර දරුවන්ට එක් හෝ තව සැකයක් ඇති වී, මෙසේ කියයි මේ-මේ කෙනා මේ දේ කරනවා. මේ කෙනා මෙහෙමයි, නැත්නම් අර විදිහයි. මේ නිසයි මා තව දුරටත් මෙහි නොපැමිණෙන්නේ. ඔවුන් අමනාප වී පිටව ගොස්, ගෙදර ඉඳගෙන සිටියි. පියා පවසන්නේ ඔබ කැමති ඕනෑම කෙනෙක් සමඟ අමනාප වන්න, නමුත් ඒකායන පියා සමඟ අමනාප නොවන්න! බාබා ඔබට මෙම අනතුරු ඇඟවීම දෙයි දඬුවම ඉතාමත්ම බරපතලයි. ඔබ මව් කුසක කුමන දඬුවමක් වින්දත්, ඊට පෙර, ඔබ කළ දේහි දර්ශනයක් ඔබට ලැබෙයි. පළමුව දර්ශන නොලැබ, දඬුවම් ලැබිය නොහැක. ඒ අන්දමින්ම, ඔබට වර්තමාන කාලය පිළිබඳවත්, ඔබ ඉගෙන ගන්නා අතර, කෙනෙක් සමඟ රණ්ඩු සරුවල් වී, ඉන්පසුව අමනාප වී, ඉගෙනුම නතර කළ අන්දම ගැනද ඔබට දර්ශන ලැබෙයි. ඔබ පියා සමඟ ඉගෙන ගත යුතු බව ඔය දරුවන්ට වැටහෙනවා. කිසිම විටෙක ඉගෙනුම නතර නොකරන්න! ඔබ මෙහි ඉගෙන ගන්නේ මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය වීමටයි. ඔබ මෙහි පැමිණෙන්නේ උසස්ම-උසස් පියාව මුණ ගැසීමටයි. සමහර විට (බලාපොරොත්තු වූවාට වඩා) දරුවන් වැඩි ගණනක් පැමිණෙයි. එබැවින් නාටකයට අනුව ඇතැම් අපහසුතාවයන් ඇති වෙයි. ඇතැම් දරුවන් මෙවන් බොහෝ කුණාටු වලට මුහුණ පායි 'මට මේ-මේ දේ ලැබුණේ නැහැ. මට මේක ලැබුණේ නැහැ!.' ඒ සෑම දෙයක්ම හිස් දේවල්ය. මරණයේ කාලය පැමිණි විට, දැනුම නැති මිනිසුන් මෙසේ අසනු ඇති හේතුවක් නොමැතිව ඔවුන් මා මරන්නේ, මා කුමන අපරාදය සිදු කළාටද? අවසානයේ රඟ දැක්වෙන ජවනිකාවට කියන්නේ, 'හේතුවක් නැතිව, ලේ වැගිරීමේ ජවනිකාවයි'. හිටි ගමන් බෝම්බ හෙලා, බොහෝ දෙනෙක් මිය යයි. එය හේතුවක් නැති ලේ වැගිරීමක් නොවේද? දැනුම නොමැති මිනිසුන් අසරණ බවින් හඬා වැටෙයි. මෙම ලෝකය විනාශ විය යුතු බව ඔබට වැටහෙන බැවින්, ඔය දරුවන් බොහෝ සතුටු වෙයි. අනෙක් ආගම් සියල්ලම විනාශ නොවූයේ නම්, එක් සත්‍ය ධර්මය ස්ථාපනය කරන්නේ කෙසේද? ස්වර්ණමය යුගයේ තිබුණේ එක් ආදි සනාතන දෙවි දේවතා ධර්මයයි. ස්වර්ණමය යුගයේ ආරම්භයේ තිබුණු දේවල් ගැන, කිසිවෙකු දන්නේ මොනවාද? මෙය ශුභදායක සංගම යුගයයි. පියා මෙහි පැමිණ ඇත්තේ ඔබ සියල්ලන්ව වඩාත්ම ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන් බවට පත් කරවීමටයි. ඔහු සියල්ලන්ගේම පියාය. ඔබ දැන් නාටකය දන්නවා. සෑම කෙනෙක්ම ස්වර්ණමය යුගයට නොයයි. එම බිලියන ගණනක ජීවාත්ම සියල්ලම, ස්වර්ණමය යුගයට යන්නේ නැත. මේ සියලුම කරුණු වැඩි විස්තරය. බොහෝ දියණිවරුන්ට මෙහි කිසිවක් වැටහෙන්නේ නැත. ඔවුන් භක්ති මාර්ගයේ සියලුම දේවල් වලට බොහෝ සේ පුරුදු වී ඇති බැවින්, මෙම දැනුම ඔවුන්ගේ බුද්ධියේ රැඳෙන්නේ නැත. ඔවුන්ට භක්තියේ යෙදෙන පුරුද්ද තිබේ. ඔවුන් පවසන්නේ දෙවියන්ට කළ නොහැක්කේ මොනවාද? ඔහුට මළ අයට පණ දීමටද පුළුවනි. ඇතැම් අය බාබා වෙතට පැමිණ මෙසේ කියයි මේ-මේ කෙනා මිය ගිය කෙනෙකුට පණ දුන්නා, එබැවින් දෙවියන්ට මෙය කළ නොහැකිද? කෙනෙක් යම් හොඳ දෙයක් කළ විට, මිනිසුන් ඔහුට ප්‍රශංසා කිරීමට පටන් ගනී. ඉන්පසුව ඔහුට අනුගාමිකයන් දහස් ගණනක් සිටියි. මෙහි ඔබ වෙතට පැමිණෙන්නේ ඉතා සුළු පිරිසකි. ඔබට උගන්වන්නේ දෙවියන් නම්, ඔබලාගෙන් ඉතාමත්ම ටික දෙනෙක් පමණක් සිටින්නේ ඇයි? මෙවන් දේ බොහෝ මිනිසුන් ඔබට කියයි. ආ ඔව්! නමුත් ඔබ මෙහිදී මිය යා යුතුයි. එහි තිබෙන්නේ ඔබගේ දෙසවන් සතුටු කිරීමේ කාරණයක් පමණයි. ඔවුන් බොහෝ ශෝභනයෙන් යුතුව අසුන් ගෙන ගීතාව හඬ නගා කියවයි. බැතිමතුන් ඔවුන්ට සවන් දෙයි. මෙහි, ඔබගේ දෙසවන් සතුටු කරවන කාරණාවක් නොවෙයි. ඔබට පවසන්නේ පියාව සිහිපත් කිරීමට කියා පමණයි. ගීතාවේ ද 'මන්මනභව' යන වදන සඳහන් කර තිබේ. පියා සිහිපත් කරන්න, එවිට ඔබගේ පාපයන් දුරු වී යයි. පියා පවසන්නේ හොඳයි, ඔබ ඔබගේ ගුරුවරයා හෝ ඔබගේ මධ්‍යස්ථානය සමඟ අමනාප වුවත්, අඩු තරමින් මේ දේ කරන්න අන් සෑම

කෙනෙක් සමඟම ඇති ඔබගේ සම්බන්ධතාවයන් බිඳ දමා, තමන් ජීවයක් බව සලකා, ඒකායන පියාව සිහිපත් කරන්න. පියා, පාරිශුද්ධකරුයි. එපමණයි! දිගින් දිගටම පියාව සිහිපත් කරන්න, එපමණයි. ස්ව දර්ශන චක්‍රය අඛණ්ඩව භ්‍රමණය කරන්න. ඔබට මෙතරම් වත් සිහි වන්නේ නම්, ඔබට නිසැකයෙන්ම දෙව්ලොව යාමට පුළුවනි. කෙසේවෙතත්, ඔබ දිව්‍යලෝකයේ උසස් තත්ත්වයක් හිමි කරගන්නේ, ඔබ දැන් දරන උත්සාහයට අනුවයි. පුරවැසියන් නිර්මාණය කළ යුතුය. එසේ නැත්නම් ඔබ පාලනය කරන්නේ කාවද? බොහෝ සේ උත්සාහ දරන අය, උසස් තත්ත්වයක් හිමි කර ගනි. මිනිසුන් උසස් තත්ත්වයක් ලබා ගැනීමට බොහෝ වෙහෙස මහන්සි වෙයි. කිසි කෙනෙකුට යම් උත්සාහයක් දරන්නේ නැතිව ජීවත් වීමට නොහැක. උසස්ම-උසස් පියා, පාරිශුද්ධකරු පියා වන්නේ කෙසේද කියා ඔය දරුවන්ට වැටහෙනවා. මිනිසුන් ඔහුගේ මෙම ප්‍රශංසාව ගායනා කරන නමුත්, එහි අරුත ඔවුන්ට නොවැටහෙයි. භාරතය බොහෝ ධනවත් විය. භාරතය දිව්‍ය ලෝකය වූ කල්හි, එය ලොවෙහි විශ්මය විය. එම විශ්මයන් හත අයත් වන්නේ මායාටයි. මුළු නාටකය පුරාම, උසස්ම වන්නේ දිව්‍ය ලෝකය වන අතර, පහත්ම වන්නේ අපායයි. ඔබ දැන් පියා වෙතට පැමිණ ඇත. අපගේ මිහිරි බාබා අපව උසස්ම ගමනාන්තයට රැගෙන යන බව ඔබ දන්නවා. ඔහුව අමතක කළ හැකි වන්නේ කාටද? ඔබ කොහේ ගියත් එක් දෙයක් සිහියේ තබාගන්න. පියා සිහිපත් කරන්න! ඔබට ශ්‍රීමත් ලබා දෙන්නේ පියා පමණයි. කතා කරන්නේ දෙවියන්ය, බ්‍රහ්මා දෙවියන් නොවෙයි. අසීමිත පියා ඔය දරුවන්ගෙන් විමසනවා දරුවනි, මා ඔබව බොහෝ ධනවත් කර පිටව ගියා. ඉතිං, ඔබ මෙතරම් පහත් වූයේ කෙසේද? කෙසේවෙතත්, ඇතැම් දරුවන් සවන් දෙන්නේ ඔවුන්ට කිසිවක් නොවැටහෙන්නාක් සේය! එබැවින් එවන් දරුවන් අපහසුතාවයන් ටිකක් අත්විඳියි. ඔබ නින්දා අපහාස, ගෞරව අගෞරව, මෙන්ම සතුට සහ දුක, දරා ගත යුතුයි. මෙහි සිටින මිනිසුන් දෙස බලන්න! ඔවුන් අගමැතිට වුවත් ගල් ගසන්නට වැඩි කාලයක් ගන්නේ නැහැ. ශිෂ්‍යයන්, අළුත් රුධිරය බව කියැවෙයි. ඔවුන්ට බොහෝ සේ ප්‍රශංසා කරයි. ඔවුන් සිතන්නේ එම ශිෂ්‍යයන් අනාගත නව රුධිරය කියාය. කෙසේවෙතත්, එම ශිෂ්‍යයින්මයි දුක ඇති කරන්නේ, ඔවුන් කොලිජි වලට ගිණි තබයි, ඔවුන් සෑම කෙනෙකුටම දිගින් දිගටම අපහාස කරති. ලෝකය පත්ව ඇති තත්ත්වය කුමක්ද කියා පියා විස්තර කරයි. නාටකයේ මුල, මැද සහ අවසානය මෙන්ම ප්‍රධාන නළුවන් ආදීන්ව නොදන්නා, නාටකයක නළුවෙක් ගැන, ඔබ කියන්නේ මොනවාද? ශ්‍රේෂ්ඨතම නළුවා වන කෙනාගේ චරිත කතාව ගැන ඔබ දැන සිටිය යුතුයි. බ්‍රහ්ම, විෂ්ණු සහ ශංකර් රඟපාන්නේ කුමන චරිත කොටස්ද හෝ ප්‍රධාන ආගම් නායකයන් රඟපාන චරිත කොටස් ගැන ඔවුන් කිසි දෙයක් නොදනී. අන්ධ විශ්වාසය ඇති මිනිසුන්, සියලු දෙනාටම ආචාර්යවරුන් කියා අමතයි. ගුරු කෙනෙක් යනු, විමුක්තිය පිරිනමන කෙනෙකි. සියලු දෙනාටම විමුක්තිය පිරිනමන ඒකායන කෙනා වන්නේ උත්තරීතර පියා, උත්තරීතර ජීවයයි. ඔහු උත්තරීතර ගුරු ද වෙයි. ඔහු ඔය දරුවන්ට දැනුමද ලබා දෙයි. ඔහු ඔබට උගන්වයි. ඔහුගේ චරිත කොටස ආශ්චර්යමත්ය. ඔහු මෙම ධර්මය ස්ථාපිත කර, අන් සියලුම ආගම් අවසන් කරයි. අනෙත් සියලුම නායකයන් කරන්නේ ආගමක් ස්ථාපනය කිරීම පමණයි. ස්ථාපනය සහ විනාශය සිදුකරවන කෙනාට, ගුරු යැයි කියයි. පියා පවසන්නේ සියලුම මරණයන්ගේ මරණය, මමයි. එක් ධර්මයක් ස්ථාපනය කර, අන් සියලුම ආගම් විනාශ වෙයි. මෙහි අරුත වන්නේ, සියලුම දේ, ඥාන යාග ගින්නට බිලි වන බවයි. ඉන්පසුව තවත් යුද්ධයක් නොතිබෙයි, එමෙන්ම වෙනත් කිසිම යාග ගින්නක් නිර්මාණය වන්නේද නැත. ඔබ දැන් මුළු ලෝකයේම මුල, මැද සහ අවසානය පිළිබඳව දන්නවා. අන් සෑම කෙනෙක්ම නිකම්ම කියන්නේ, ‘නැති, නැති‘ (මෙයත් නොවෙයි එයත් නොවෙයි) කියාය. ඔබ එසේ නොකියයි. පියා හැර වෙනත් කිසිවෙකුට ඔබට විස්තර කළ නොහැක. එබැවින් ඔය දරුවන් බොහෝ සතුට අත්විඳිය යුතුයි. කෙසේවෙතත්, මායා ඔබට කෙසේ හරස් වනවාද කිවතොත්, ඇය ඔබගේ සිහිකිරීම අවසන් කර දමයි. ඔය දරුවන් සතුට, දුක මෙන්ම ගෞරව සහ අගෞරවද දරා ගත යුතුයි. ඇත්ත වශයෙන්ම මෙහි කිසිම කෙනෙකුට අපහාස කෙරෙන්නේ නැත. යම් දෙයක් සිදු වූවොත් එය පියාට වාර්තා කරන්න. ඔබ එය වාර්තා නොකරන්නේ නම්, ඔබට පාපයන් එකතු වෙයි. ඔබ පියාට ඒ ගැන කියූ විට, විගසින්ම ඔවුන්ට අනතුරු ඇඟවීමක් කෙරෙයි. ශල්‍යවෛද්‍යවරයා ගෙන් කිසි දෙයක් නොසඟවන්න. ඔහු ඔබට දැනුමේ එන්නත ලබා දෙයි. එයට දැනුමේ ආලේපය කියාද කියයි. මෙහි දැනුමට, දැනුමේ කාජල් (ඇස් සැරසිලි) යැයිද කියයි. මෙහි විජ්ජා ආදිය ගැන ප්‍රශ්නයක් නැත. පියා පවසන්නේ මා පැමිණ ඇත්තේ ඔබට අපවිත්‍ර බවින් පිවිතුරු වන අන්දම පෙන්වා දීමටයි. ඔබ පිවිතුරු වන්නේ නැත්නම්, ඔබට කිසි දෙයක් ධාරණය කරගත නොහැක. පාපයන් සිදුවන්නේ රාගය නිසාය. ඔබ රාගය ජයගත යුතුයි. ඔබ රාගයේ ගැලෙන්නේ නම්, ඔබට වෙනත් කෙනෙකුට එය නොකරන ලෙස කිව නොහැක. එය විශාල පාපයක් වෙයි. පියා මෙසේ කියූ පණ්ඩිතයාගේ කතා පුවත කියා දෙයි ‘රාමා රාමා‘ කියා ජප කරන්න, එවිට ඔබට සාගරය තරණය කිරීමට හැකි වෙයි. මිනිසුන් සිතන්නේ, එයින් කියැවෙන්නේ ජල සාගරයක් පිළිබඳව

කියා. කෙසේවෙතත්, ඔබට අහසේ කෙළවරට ලඟා වීමට හෝ සාගරයේ පතුලටම යෑමට නොහැකි සේම, බ්‍රහ්ම තත්ත්වයටද අවසානයක් නොමැත. මෙහි මිනිසුන් සෑම දේකම පතුලටම යෑමට උත්සාහ දරන නමුත්, එහිදී ඔවුන්ට කිසිම උත්සාහයක් දැරීමට අවශ්‍ය වන්නේ නැත. මෙහි, ඔවුන් අවකාශයේ කෙතරම් ඈතට ගියත් ඔවුන් පෙරලා ආපසු පැමිණිය යුතුයි. ඔවුන්ට ඇති තරම් ඉන්ධන නොමැති නම්, ඔවුන් ආපසු පැමිණෙන්නේ කෙසේද? එය විද්‍යාඥයින්ගේ උපරිම අහංකාරකමයි. එම දේවල් තුළින් ඔවුන් විනාශය ගෙන එයි. ගුවන් යානා නිසා සතුට ඇති වන නමුත් ඒවා නිසා උපරිම දුකද සිදු විය හැක. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණු දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. කිසිම හේතුවක් නිසා ඉගෙනුම නොනවත්වන්න. දඬුවම් ඉතාමත්ම බරපතලයි. එබැවින් තමන්ව ඉන් ආරක්ෂා කරගැනීමට, අන් සියලුම සම්බන්ධතා බිඳ දමා, ඒකායන පියාව සිහිපත් කරන්න. අමනාප නොවන්න.
2. දැනුමේ එන්නත හෝ ආලේපය ලබා දෙන්නේ ඒකායන පියා පමණයි. සදාතනික ශල්‍යවෛද්‍යවරයාගෙන් කිසිවක් නොසඟවන්න. පියාට කීමෙන්, විගසින් ඔබට අනතුරු ඇඟවීමක් ලැබෙයි.

**වරදානය:** නිරෝගී ශරීරයක්, සතුටු සිතක් සහ මෙම ඥානයේ ධනය ලැබීමෙන් ඔබ මහත් වාසනාවන්ත වේවා.

සංගම් යුගයේ දී, ඔබ නිරන්තරයෙන් ඔබේ මුල් අවධියේ ස්ථාවරව සිටින විට, ඔබේ කර්ම විඳවීම් කුරුසයකින් කටුවක් බවට පත් වන අතර, ශරීරයේ ඕනෑම රෝගයක් (රෝග්) යෝගාව බවට පත් වන අතර එමඟින් ඔබ නිරන්තරයෙන් නිරෝගී වේ. "මන්මනභාව්" හි ස්ථාවර වීම නිසා ඔබේ සතුටේ පතල නිරන්තරයෙන් පිරී ඇති අතර මේ නිසා ඔබට සතුටු මනසක් ඇත, මන්ද, ඔබේ ඥාන ධනය සියල්ලටම වඩා උසස් ධනයයි. පදාර්ථය ස්වභාවිකවම මෙම ඥාන ධනය ඇති අයගේ සේවකයෙකු බවට පත්වේ. ඔබට සියලු සබඳතා ඇත්තේ ඒකායනය සමඟයි, ඔබට ශුද්ධ හංසයන් සමඟ සම්බන්ධතා ඇති අතර එබැවින් ඔබට ඉබේටම මහත් වාසනාවන්ත වීමේ ආශිර්වාදය ලැබේ.

**පාඨය:** සිහිපත් කිරීමේ සහ සේවය කිරීමේ තුලනය ද්විත්ව අගුලකි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ජීව අවධාන ස්ථිතියේ රැඳී සිටීම පුහුණු කරන්න, අභ්‍යන්තරගත වන්න.**

**ඔබට බොහෝ උපත් ගණනාවක් තිස්සේ ඔබේ ශරීරයේ ස්වරූපය පිළිබඳ ස්වභාවික අවධානය තිබුණා සේම, කෙටි කාලයකටවත් ඔබේ මුල් ස්වරූපයෙහි අවධානය ඔබට අත්විඳිය නොහැකිද? මෙම පළමු පාඩම සම්පූර්ණ කරන්න, එවිට ඔබ, සියලු ජීවාත්මයන්ට ඔබේ ජීවාත්ම අවධානය තුළින් දර්ශනයක් ලබා දීමට උපකරණයක් බවට පත්වනු ඇත.**